www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඔබාමාගේ සන්ධානය තුල පන්ති බෙදීම පැන නැගීම ඇරඹේ

## Class divisions begin to emerge in Obama coalition

**ඇමරිකනු සමාජවාදී සමානතා පක්ෂයේ ජනාධිපති අපේක්ෂක ජෙරී වයිට් විසිනි**
**2008 නොවැම්බර් 6**

නොවැම්බර් 4 දා බරක් ඔබාමා එක්සත් ජනපද ජනාධිපතිවරනයෙන් ජය ලැබුවේ ජනාධිපති බුෂ්ගේ පාලනාධිකාරයට සහ රිපබ්ලිකන් පක්ෂයට එරෙහිව නැගී සිටින ජනතා විරෝධයේ රැල්ලක් මත නැගීගෙන ය. මිලියන ගනන් ඡන්ද දායකයෝ දශක ගනනාවක් තිස්සේ ඇමරිකාව තුල අධිකාරය දරා සිටි සමාජ ප්‍රතිගාමිත්වයේ දේශපාලනයට මෙම ජනාධිපතිවරනයේදී දැවැන්ත පහරක් එල්ල කලෝ ය.

එසේ වුව ද ''ඔබාමා සන්ධානය'' ප්‍රතිරෝධයන්ගේ බරින් මිරිකී ඇත. ඔබාමාට ඡන්දය දුන් බහුතරයට අවශ්‍යවී පවතින්නේ සමාජ අසමානතාවය අහෝසි කිරීමට ය, ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් අහෝසිවී යාම වැලැක්වීමට ය, යුදවාදය අවසන් කිරීමට ය. ඔබාමා ''මහවීදිය සහ වෝල් වීදිය එක්සත් කිරීමට,'' පෝසතුන් හා දුප්පතුන් එකතු කිරීමට මැත දෙඩවුවත් ඔහු බැඳී සිටින්නේ ඇමරිකාවේ මහා සංගත ප්‍රභූවේ වඩාත්ම බලගතු කොටස් වලට ය. ඩිමොක්‍රටික් පක්ෂය දැනටම ඉදිරියේ බලයට එන ඔබාමා පාලනාධිකාරය පිලිබඳ ජනතා අපේක්ෂාවන් ලිහිල් කර දැමීමට කැසකවයි. ජනාධිපතිවරනය ජයග්‍රහනය කල පසු ඔබාමා චිකාගෝ නුවර දී කල තම විජයග්‍රාහී දේශනයේදී තැත් කලේ ද එසේ කිරීමට ය. ඔහු මෙසේ කීය, ''ඉදිරි මාවත දීර්ඝ හා දුෂ්කර වනු ඇත. - අපට අපේ ඉලක්කය කරා අවුරුද්දකින් තබා එක් ජනාධිපති වාරයකින් පවා යා ගැනීමට හැකි වනු නැත. ජනාධිපතිවරයා හැටියට මා ගනු ඇති සෑම තීන්දුවකට ම හෝ පිලිවෙතකට ම එකඟ නොවන බොහෝ දෙනා සිටිනු නියත ය. ආන්ඩුවට සෑම ප්‍රශ්නයක් ම විසඳිය නොහැකි වනු ඇති බව මම ද දනිමි.''

ඩිමොක්‍රටික් පක්ෂයේ ප්‍රධාන පෙලේ නායකයෝ මැතිවරන තීන්දුව වනාහී ප්‍රතිපත්තිවල සැලකිය යුතු වෙනසක් සඳහා දෙන ලද ජන වරමක් නොවේ යයි තහවුරු කරගැනීමට පෙලගැසී සිටිති. ඔවුන් කියන්නේ මීලඟ පාලනාධිකාරය පක්ෂ දෙකට පය ගසාගෙන ''මැදින් සිට'' රිපබ්ලිකානුවන් සමග දෙපාක්ෂික සන්ධානයක් මත පදනම් ව කරගෙන යා යුතු යයි කියාය.

*වොෂිංටන් පෝස්ට්* පුවත්පතේ පල වූ ''දුෂ්කර තීන්දු සහ අභියෝග එයි'' යන මාතෘකාවෙන් යුතු ලිපියක් ඔබාමාගේ උපදේශකයන් ගනනාවක් මෙසේ කියා සිටි බව සඳහන් කලේ යඃ ''මැතිවරන ප්‍රතිඵල නොපසුබට නිදහස්වාදී පාලනයක් සඳහා දෙන ලද ජනවරමක් යයි අර්ථකථනය කිරීමේ අනතුර ගැන අපි මැනවින් දැනුවත්ව සිටිමු''.

වෙනත් වචනවලින් කිවහොත් ඩිමොක්‍රටික් පාක්ෂිකයන් කියා සිටින්නේ - ධවල මන්දිරයේ පාලනය ද කොන්ග්‍රසයේ මහත් වැඩි බලයක් ද තමන් අතට ලබා දුන් ජනවරමේ උනුසුම යන්නටත් පෙර - ඇමරිකානු ජනතාවගේ මතය ප්‍රතික්ෂේප කල යුතු ය යන්න ය. ජනාධිපති ඡන්ද විමසීමේ දී මුලුමනින්ම ප්‍රතික්ෂේප වූ ද අතිශයින්ම දක්ෂිනාංශික වූ ද මහධනේශ්වර ජාවාරම්වලට පක්ෂපාතී දේශපාලන සංස්ථාපිතයේ කොටස් සමග හවුල්ව නව පාලනයේ පිලිවෙත තීන්දු කල යුතු යයි ඔවුහු කියා සිටිති. ඩිමොක්‍රටික් පක්ෂයේ මෙම ආස්ථානය සමානවන්නේ 2000 දී මහජන ඡන්ද ප්‍රමානයෙන් පරාජයට පත් වූ ද 2004 දී බහුතරයක් දිනාගැනීමට අසමත් වූ ද තම දක්ෂිනාංශික න්‍යායපත්‍රයට ජනවරමක් පැවතියේ යයි ජනාධිපති බුෂ් දරාසිටි ආස්ථානය සමග ය.

ඩිමොක්‍රටික් පාක්ෂිකයෝ රිපබ්ලිකානුවන් හා සහයෝගීව වැඩ කරන ගමන්ම දැන් උත්සන්න වෙමින් එන ආර්ථික ව්‍යසනයට කිසියම් සහනයක් ඉදිරියේ එන ඔබාමාගේ පාලනාධිකාරයෙන් ලැබෙතැයි මහජනතාවට පවත්නා අපේක්ෂාවන් යටපත් කර දැමීමට දැනටම වැඩ කරගෙන යමින් සිටිති.

*වොෂිංටන් පෝස්ට්* පුවත්පත කියාසිටි පරිදි ඔබාමාගේ උපදේශකයෝ සමහර ඩිමොක්‍රටික් පාක්ෂික ඡන්දදායක කොටස් සමග ඝට්ටනයකට සූදානම්ව සිටිති. එසේ ම ඔබාමා මුල්තැන දෙන ප්‍රතිපත්ති ගැන නොඉවසිලිමත්ව ඝට්ටනකාරී ඉල්ලීම් ඉදිරිපත් කිරීමට යාහැකි කොන්ග්‍රස් මන්ඩලයේ ලිබරල්වාදී ඩිමොක්‍රටික් පාක්ෂික මන්ත්‍රීන් සමග ගැටීමට ද ඔවුහු සැරසෙති. එපමනක් නොව මතුවිය හැකි එවන් ඉල්ලීම් පතික්ෂේප කිරීමට ද ඔවුහු සූදානම්ව සිටිති.

ඔබාමාට බලය පැවරාගැනීම සංවිධානය කරන කන්ඩායමේ උපදේශකයකු වන කලින් ජනාධිපති ක්ලින්ටන්ගේ මාන්ඩලික ප්‍රධානියා ව සිටි ලියෝන් පැනෙටා නව ජනාධිපතිවරයා ගැන නිව් යෝර්ක්

ටයිම්ස් පුවත්පතට මෙසේ පැවසීය. ''අමාරු පියවර මුලින් ම ගත යුතුව තිබේ. මන්ද යත් දැඩි තීන්දු කල් තැබීමට ද පය බුරුලෙන් තබා සොහොන් බිමෙන් සේන්දු වීගැනීමට ද හැකි යයි ඔබ සිතුවොත් බොහෙවින් කරදරයේ වැටෙනු නියත ය. පැනෙටා මෙසේ ද කීය. ''වේදනාකාරී කැපකිරීම් ඇති කරන තීන්දු ඉස්ඉස්සරලා ම ගත යුතුය''.

ඒ සමග ම ධවලමන්දිරයේ මාන්ඩලික ප්‍රධානියා ලෙස රහ්ම් ඉමානුවල් තෝරාපත් කරගැනීම මගින් පෙන්නුම් කර ඇත්තේ තම පාලනාධිකාරය ගෙඩනගා ගැනීම සඳහා ඔබාමා මොන ජාතියේ සමාජ කොටස් එක් රැස් කරගනිමින් සිටිනවාද යන්න ය. දැනට නියෝජිත මන්ත්‍රී මන්ඩලයේ ඩිමොක්‍රටික් පාක්ෂික කන්ඩායමේ සභාපතිවරයා වන ඉමානුවල් වනාහී හිටපු ජනාධිපති බිල් ක්ලින්ටන්ගේ ජ්‍යෂ්ඨ උපදේශකයෙක් ව සිටිමින් නීතිය හා සාමය, සුභසාධන කප්පාදුව වැනි ප්‍රතිගාමී පියවරයන් ක්‍රියාත්මක කලා වූ ද ඩිමොක්‍රටික් පක්ෂයේ ලිබරල්වාදී ප්‍රතිසංස්කරන සමග ඉතුරුපහදුව පැවති පැරනි සම්බන්ධතාවයන් නැත්තටම නැති කිරීම සඳහා ක්‍රියාකල වූ ද තැනැත්තෙකි.

පසුව ක්ලින්ටන් පාලනාධිකාරයෙන් ඉවත්වූ හෙතෙම 1999 සිට 2002 දක්වා චිකාගෝ නුවර ඩ්‍රෙස්ඩ්නර් ක්ලෙයින්වෝට් වොසර්ස්ටයින් නම් ගෝලීය ආයෝජක බැංකු සමාගමේ සේවකයකු ලෙස කටයුතු කල අතර එසමයෙහි ඩොලර් මිලියන 18ක් උපයා ගත් බව වාර්තාගත ය.

2002කේ කොන්ග්‍රස් මන්ඩල මැතිවරන ව්‍යායාමයේ යෙදී සිටි ඉමානුවෙල් ඒ අතර ම ඉලිනොයි ප්‍රාන්තයේ ඩිමොක්‍රටික් කොන්ග්‍රස් මන්ඩල කන්ඩායමෙන් කැඩී වෙන්වෙමින් ඉරාකයට එරෙහි යුද්ධය දියත් කිරීම සඳහා එලිපිටම ජනාධිපති බුෂ්ට සහාය දුන්නේ ය. නියෝජිත මන්ත්‍රී මන්ඩලයේ ඩිමොක්‍රටික් නායකත්වයේ හතරවෙනි තැනට නැගගෙන සිටින මොහු පසුගිය සතිවල ලෝක ආර්ථික අර්බුදය මැද්දැවේ වෝල්වීදියේ යෝධ බැංකු බේරා ගැනීම සඳහා දෙන ලද ඩොලර් බිලියන 700ක පිදේන්නට ද ඉහලම සහායක් දුනි. ඉස්රායලය සමග සමීප සබඳතා පවත්වන මොහු ක්ලින්ටන්ලා ද සෙනේට්සභික ජොශප් ලිබර්මාන්ද වැනි තැනැත්තන් සහිත දක්ෂිනාංශික ඩිමොක්‍රටික් නායකත්ව මන්ඩලයේ ප්‍රධානපෙලේ සාමාජිකයෙකි. මොහු භාන්ඩාගාර සහ ආරක්ෂක ලේකම්වරුන් ඇතුලු කැබිනට් පත්වීම්වල දී බලගතු භූමිකාවක් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රාග්ධන වෙලඳපලවල් ද විදේශ ප්‍රතිපත්ති හා මිලිටරි සංස්ථාපිතය ද පිනවීම සඳහා මෙම තනතුරු ඉක්මනින්ම පුරවාලනු ඇතැයි අපේක්ෂා කෙරේ. භාන්ඩාගාර ලේකම් තනතුරට පත්කිරීමට සලකාබලනු ලබන්නන් අතර හිටපු ජනාධිපති ක්ලින්ටන්ගේ භාන්ඩාගාර ලේකම්ව සිටි ලෝරන්ස් සමර්ස් ද නිව්යෝර්ක් ෆෙඩරල් රිසව් බැංකුවේ ප්‍රදේශීය සභාපති තිමොති ගෙයිට්නර් ද ෆෙඩරල් රිසව් මහ බැංකුවේ හිටපු සභාපති පෝල් වොල්කර් ද වෙති. වොල්කර් සදාකාලිකවම සිහි කෙරෙනු ඇත්තේ 1980 ගනන් වල මුල් කාලයේ පොලී රේට්ටු සියයට 20 දක්වා ඉහල දමමින් කාර්මික නිෂ්පාදන රැකියා මිලියන ගනන් සිතාමතාම වනසා දමමින් ඇමරිකානු කම්කරු පන්තියේ ජීවන තත්වයන් දරුනු ලෙස පහත දැමුවා වූ ''වොල්කර් ශොක්'' යන නමින් ප්‍රසිද්ධවූ කම්පන පිලිවෙතේ කර්තෘවරයා ලෙස ය. වොල්කර් පිලිබඳව ඇමරිකානු කම්කරු පන්තියට අමතක කල නොහැකි තවත් කරුනක් ද වේ එනම් 1981 පැට්කෝ ගුවන් ප්‍රවාහන නියාමකයන්ගේ වැඩ වර්ජනය කුඩු කර දැමීම ගැන ඔහු එකල ජනාධිපති වූ රීගන්ටු කල ප්‍රශංසාවයි. පැට්කෝ වර්ජනය බිඳ දැමීම වනාහී උද්ධමනය පාලනය සඳහා ඉතාම වැදගත් සාධකය වී යැයි වොල්කර් උදම්ඇනීය. රොයිටර් වාර්තා අනුව ඉරාකයේ සහ ඇෆ්ඝනිස්තානයේ එක්සත් ජනපද යුද්ධ ආක්‍රමනයන් දිගින් දිගටම පවත්වාගෙන යාමට සැරසෙන ඔබාමා ජනාධිපති බුෂ්ගේ ආරක්ෂක ලේකම්වරයා වන රොබට් ගේට්ස් එම තනතුරේම තබාගැනීමට හෝ තමාගේ සමීප උපදේශකයකුවන හිටපු නාවුක හමුදා ලේකම් රිචඩ් ඩැන්සිග් එම තනතුරට පත් කිරීමට සැරසෙමින් සිටී. එම තනතුර සඳහා සලකාබලනු ලබන වෙනත් නම් අතර ඩිමොක්‍රටික් සෙනෙට් මන්ත්‍රී ජෝන් කෙරී ද හිටපු රාජ්‍යතාන්ත්‍රික රිචඩ් හොල්බෲක් ද සෙනේට් මන්ත්‍රීධුරය අහෝසිවී යන රිපබ්ලිකනු පාක්ෂික චක් හැගල් ද ජෝර්ජියා ප්‍රාන්තයේ හිටපු සෙනේට් මන්ත්‍රී සැම් නන් ද වෙති. මේ සැම කෙනෙක් ම බෝල්කන් ප්‍රදේශයේ සිට හයිටි දූපත දක්වා ද මැදපෙරදිග සහ මධ්‍යම ආසියාව හරහා මුලුලොව පුරාම ද අමරිකානු අධිරාජ්‍යවාදයේ අපරාධයන් සියල්ලටම ඒ හෝ මේ ආකාරයෙන් කරගැසුවන් ය.

පසුගිය අගහරුවාදා කල තමාගේ ජයග්‍රාහී කථාවේදී ඔබාමා යලියලිත් තහවුරු කරගැනීමට උත්සාහ කල කරුනක් නම් ලෝකයේ බල ශක්ති සම්පත් බහුල ප්‍රදේශවල ඇමරිකානු පාලක ප්‍රභූවේ භූ-දේශපාලන ආසක්තයන් තහවුරු කරලීම සඳහා ව්‍යාජ හේතුවක් ලෙස ''ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය'' ඉදිරිපත් කොට බුෂ් පාලනාධිකාරය විසින් පවත්වා ගෙන යනු ලබන ආක්‍රමනය නොනවත්වා ඉදිරියට ගෙන යාමට තමාද කැපවී සිටින බවය. ඔබාමා මෙසේ අනතුරු හැගවීය. ''මෙම ලෝකය ඉරාදැමීමට සූදානම් වන අයට (මම මෙසේ කියමි) අපි නුඹලාව පරාජය කරන්නෙමු.'' ඇමරිකානු හමුදාවන් ඉරාකයට සහ ඇෆ්ඝනිස්ථානයට යවා ඇත්තේ ''ඔවුන්ගේ ජීවිත අප උදෙසා පරදුවට තැබීමට ය.''යන පට්ටගහපු පචය යලිත් තම දේශනයේ දී ඇදබෑ ඔබාමා ඉරාකයට සහ ඉරානයට ඇමරිකානු හමුදා යවා ඇත්තේ ධනේශ්වර පන්තියේ නොව වැඩ කරන ජනතාවගේ උවමනා එපාකම් ආරක්ෂා කිරීමට

ය යන වැරහැලි වූ බොරුව යලිත් තහවුරු කිරීමට උත්සාහ කලේ ය. හමුදාවට බලහත්කාරයෙන් බඳවා ගැනීම ට කියාත්මක කිරීමට තමා සූදානම් බව අඟවා සිටි ඔබාමා ''ඇමරිකානු ජනතාව අලුත්වූ ධෛර්යයකින් සේවය සඳහා කැපවී ගත යුතු ය''යි තරයේ කියා සිටියේ ය.

ඩිමොක්‍රටික් පාක්ෂික ජනාධිපතිවරයෙකු පත් කර ගැනීම මගින් බුෂ් පාලන සමය තුල උග්‍ර කරන ලද ආර්ථික පිලිවෙත් මෙන්ම, මිලිටරි ආක්‍රමනයන් ද අවසන් කල හැකියි සිතා සිටින ඡන්ද දායකයන් සමග ඔබාමාගේ පාලනාධිකාරය අනිවාර්යයෙන්ම ගැටෙනු ඇත. මෙම තතු අපේක්ෂා කරන ඩිමොක්‍රටික් පාක්ෂිකයෝ ඉරාකයෙන් ඇමරිකානු හමුදාව ''තකහනියක්'' ඉවත් කර ගැනීමට තමන් විරුද්ධ බව ද ඇෆ්ඝනිස්තානයේ කරගෙනයන ''හරි යුද්ධය'' උත්සන්න කලයුතු බව ද ප්‍රකාශ කරමින් මහජනතාවගේ යුදවිරෝධී හැඟීම් නිවා දැමීමට උත්සාහ කරති.

© www.wsws.org